# ශිව - පාර්වතී දේව සංකල්පය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. තුසිත ප්‍රියංකර රත්නායක
කැලණිය විශ්වවිද්‍යාලය
thusithaprathnayaka@gmail.com

**සාරසංක්ෂේපය**

ථෙරවාදී බුදු දහමට සාපේක්ෂ ව ජනප්‍රිය බුද්ධාගම ශිෂ්ටසම්පන්න සමාජයක් ගොඩනඟන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ. ජනප්‍රිය බුද්ධාගමේ දක්නට ලැබෙන දේව සංකල්පය එහි ලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කරයි. ''හින්දු සම්ප්‍රදාය සංකීර්ණ චින්තන හා ආචරණ පද්ධති කිහිපයකින් සමන්විත ය. ඒ අතුරෙන් ශිව ඇදහිල්ල, විෂ්ණු ඇදහිල්ල සහ ශක්ති ඇදහිල්ල ප්‍රධාන තැනක් ගනී. 'ශුද්ධ වූ වස්තූන් ආශ්‍රිත විශ්වාස සහ පරිචිති පිළිගත් සියලුදෙනා ම එක ම ආචාර ධර්ම සමාජයකට බැඳ තබන විශ්වාස හා පරිචිති පද්ධතිය ආගම වේ.' යන අර්ථකථනය එක්තරා විදියකින් හින්දු පද්ධතීන්ට ගැළපේ.'' යනුවෙන් මේ සම්බන්ධයෙන් මහාචාර්ය ඒ. සතාසිවම් සූරීන් දක්වා ඇති අදහස ඉතා වැදගත් ය. මෙම ප්‍රකාශය හින්දු සම්ප්‍රදාය මූලික කර ගත්ත ද ජනප්‍රිය බුද්ධාගමෙන් පෝෂණය වූ ලාංකේය සමාජයට ආදේශ කරගත හැකි ය. හින්දු දෙවිවරුන්, ජනප්‍රිය බුද්ධාගම යටතේ පූජාවට ලක් වන බැවිනි. ශිව දෙවියාගේ භාර්යාව පාර්වතියයි. මේ දෙදෙනාගේ දරු දෙදෙනා ස්කන්ධ හා ගණපතියි. ස්කන්ධ දෙවියාටත් ගණපතිටත් සෙසු දේව පිරිවරට වඩා ප්‍රමුඛස්ථානයක් ලැබී තිබේ. 'මහාදේව' යනුවෙන් ද හැඳින්වෙන ශිව යන්නෙහි 'සුබ' යන අර්ථය ඇත. මේ නම ඔහුට යෙදෙන්නේ සියලු ම දෙවිවරුන් එක් ව ගත් කල ඇති බලයට වඩා බලයක් ඔහුට ඇති බැවිනි. ලාංකිකයන් අතර මේ ශිව-පාර්වතී සහ ඔවුන්ගේ දරුවන් වන්දනය කිරීම බෙහෙවින් ම ප්‍රකට ය. මේ පර්යේෂණයේ අරමුණ වන්නේ ලාංකේය ජනප්‍රිය බුද්ධාගමට අයත් පූර්වෝක්ත දේව ගණයා වන්දනය කිරීම හා තදනුබද්ධ මානව විද්‍යාත්මක වටිනාකම පිළිබඳ ව අධ්‍යයනය කිරීම ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව මේ සඳහා දත්ත රැස් කෙරුණේ සාහිත්‍ය මූලාශ්‍රයවලින්, ප්‍රත්‍යක්ෂ නිරීක්ෂණවලින් සහ දේව භක්තිකයන් මෙන් ම දේවාලවල කපු මහතුන් සමග සිදු කෙරුණු සම්මුඛ සාකච්ඡාවලිනි. දරු ඵල අපේක්ෂාවෙන් ඇදහීමට ලක් වූ දෙවිවරුන් අතරින් ශිව දෙවියන් ප්‍රමුඛ තැන් ගන්නා බවත් ශිව ලිංගයට රතු මල් මාලයක් පළඳවා කිරි දියරෙන් සෝදා එම කිරි පානයෙන් දරුවන් ලැබෙන බවත් ශ්‍රී ලාංකිකයන් දැඩි ව විශ්වාස කරන බව මේ පර්යේෂණයෙන් අනාවරණය විය. විශේෂයෙන් ම කුඩා දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවල සඵලත්වය උදෙසා දීර්ඝ කාලයක පටන් ගණ දෙවි වන්දනය කරන බවත් තාක්ෂණය දියුණු වර්තමානයේ පවා ඒ විශ්වාසය ශ්‍රී ලාංකිකයන් අතර පවතින බවත් අනාවරණය විය. මෙලෙස දෙවිවරුන් මූලික කරගෙන සිදු කෙරෙන වන්දනමාන සාමූහික ව සිදු කිරීම ඊට මානව විද්‍යාත්මක වටිනාකමක් ගෙනදීමක් ද වේ.

**ප්‍රමුඛ පදඃ** ජනප්‍රිය බුද්ධාගම, ථෙරවාදී බුද්ධාගම, මානව විද්‍යාත්මක වටිනාකම, ශිව-පාර්වතී, හින්දු සම්ප්‍රදාය

# An Anthropological Study of the Shiva – Parvathi Deity Concept

R. M. Thusitha Priyankara Rathnayake
Candidate of MPhil
University of Kelaniya
thusithaprathnayaka@gmail.com

**Abstract**

Compared to Theravada Buddhism, popular Buddhism functions as a mechanism to build a civilized society. The concept of God found in popular Buddhism fulfills a pioneering mission "The Hindu tradition consists of several complex systems of thought and belief. Among them, the faith of Shiva, the faith of Vishnu, and the faith of Shakthi occupy a central place. 'Beliefs related to sacred objects and pachithi Basalk are beliefs and pachim thart bind everyone into a single ethical society.' This religion fits the systems of Hinduism in a way. In this connection." The idea given by Professor Sathasivam surin is very important. This statement can be substituted for Sri Lankan society, which is based on Hindu tradition but nurtured by popular Buddhism Because Hindu gods are sacrificed under popular Buddhism Lord Shiva's wife is Parvathi. The two children of these two are Skandha and Ganapathi. God Skandha and Ganapathi have a prominent position over the rest of God's entourage Shiva, also known as 'Mahadeva' means 'happiness'. This name is applied to him because he has more power than all the gods combined. The worship of this Shiva, Parvathi and their children are very popular among Sri Lankans. The purpose of this research is to study the worship of the prescient deity of Sri Lankan popular Buddhism and the closely related anthropomorphic values According to the qualitative research method, data was collected from literature sources, direct observations and interviews with devotees as well as temples. Crows. Some research also revealed that the Sri Lankans believe that Lord Shiva takes priority to giving birth to children and wearing a garland of red flowers is washed with milk and drinking their milk gives birth to children. People worship to God Ganapathi to achieve success in kids' educational activities this belief has existed among Sri Lankans for a long time and the collective worship of the deities brings anthropological values to it.

**Keywords:** Anthropological Values, Hindu Tradition, Popular Buddhism, Shiva - Parvathi, Theravada Buddhism